

## මාධ්‍ය සහෘදයකුගේ වෙන්වයාම

# ජගත් රණතුංග

ශ්‍රීලාල් සෙනෙවිරත්න



ජගත් රණතුංග හැට විය සපුරමින් සිටියදී ඉකුත් දා අප අතරින් සඳහටම සමුගත්තේය. එය ඔහු අපේක්ෂාවෙන් සිටි සමුගැනීමක් වූ බව වසර දෙකකට පමණ පෙර ඔහු සිය පවුලේ සාමාජිකයන් ආමන්ත්‍රණය කරමින් ලියා ලැමිනේට් ආරක්ෂණයක්ද යොදා සුරක්ෂිත කොට නිවසේ තබා තිබූ අවසන් කැමත්ත පිළිබඳ සංක්ෂිප්ත සටහන සාක්ෂි දැරුවේය.

ජගත් රණතුංග එක් එක් සමාජ කුලකයන් දැන හඳුනාගෙන සිටියේ ඒ ඒ සමාජ කුලකයේ සඟයෙකු ලෙසටය. පිරිසකට ඔහු චිත්‍ර ශිල්පියෙක් වීය. තවත් පිරිසකට ඔහු කවියෙකු වීය. තවත් පිරිසකට ඔහු ග්‍රන්ථ කර්තෘවරයෙක් වීය. ජනතාව දැනුම්වත් කිරීමේ ව්‍යාපෘති තුළ සම්පත්දායකයෙකු ලෙසින් ඔහු හඳුනාගෙන සිටි පරිසක්ද වීය. ඒ අතර වැඩි පිරිසක් ඔහු දැන සිටියේ ජනමාධ්‍යවේදියෙකු ලෙසින් යැයි සිතමි. මන්ද ඔහුගේ ජීවිතයේ වැඩි කාල පරාශයක් එම භූමිකාව තුළ ගෙවා තිබූ බැවිනි. ජගත්ගේ අවශේෂ භූමිකා බොහෝ කොට ආත්ම තෘප්තිය සහ ජීවත්වීමේ අරගලයට විසඳුම් සොයා දරන ලද ප්‍රයත්නයන්හි ප්‍රතිපලයන් වීයැයි කිව හැකිය.

ජගත් සහ මා අතර මිත්‍රත්වය ගොඩනැඟෙන්නේ ඔහු දිණමින පුවත්පතේ විශේෂාංග අංශයේ උප කර්තෘවරයෙකු ලෙස සේවයට එක්වීමෙන් පසුවය. ඒ වන විට ලේක්හවුස් ආයතනයේ මාධ්‍යවේදියෙකු වූ මම දිනමිණ පුවත්පතේ ප්‍රවෘත්ති අංශයේ උප කර්තෘවරයෙකු ලෙස කටයුතු කරමින් සිටියෙමි. එහිදී පිටු සැළසුම් අංශයට නිතර මා ගමන් කළේ ජගත් රැඳී සිටි උප කර්තෘ අංශය පසුකරමිනි. එබැවින් නිතර නිතර එකිනෙකා මුණගැසීම මිත්‍ර සමාගමයේ ආරම්භක මතක සටහන් අතර වේ. ජගත්ට පැවරී තිබුණේ දිනමිණ විශේෂාංග අංශයෙන් සකස් කෙරෙන බෞද්ධ අතිරේඛය සංස්කරණය කිරීමය. එම වගකීම පවරා තිබුණේ දිණමිනට පැමිණීමට පෙර ඔහු කිසියම් බෞද්ධ සඟරාවක සංස්කාරකයෙකු වූ බව දැන සිටි එවක දිනමිණ කර්තෘ සී. දොඩාවත්ත විසිනි.

ජගත් සහ මා අතර වඩාත් සමීප මිත්‍රත්වයක් ඇතිවීමට ඔහු තුළ ජීවත්වූ මානවවාදියා හේතු වීය. කල්ගත වන අතර මාස කිහිපයක් විශේෂාංග අංශයෙන් අතුරුදහන්ව සිටි ජගත් නැවත ලේක්හවුසියට පැමිණියේ ගිලනෙකු ලෙසිනි. ඇස් පෙනීම දුර්වලවීම හේතුවෙන් ඒ වන විට ඔහුට ලේක්හවුසියේ පඩිපෙළ නැඟ ගැනීමට පවා අසීරු තත්ත්වයක් තිබිණ. කාගේ හෝ ආධාරයෙන් අපහසුවෙන් ඒ බාධකය ජයගෙන කොරිඩෝරය දිගේ ඔහු ඇවිදගෙන ගියේ දෙපසට විසි වෙවීය. සර්වාංගයම බලවත් ආකාරයෙන් කිසියම් අකර්මන්‍යතාවයකට ලක්ව තිබීම නිසා ඔහුගේ දෙපා රැඳුනේ ඔහු අඩිය තබන්නට සිතන ස්ථානයේ නොවීම ඊට හේතුවීය. ඔහු පැවසුවේ සති කිහිපයක දඹදිව වන්දනා ගමනක් ගොස් පැමිණි බවත්, ගමන අතර ඉන්දියාවේදී ගත් ආහාර විෂවීමක් හේතුවෙන් එරටදීම දැඩි ලෙස රෝගී වී රෝහල්ගතව සිටින්නට සිදුවූ බවත්ය. එසේ තිබියදී ඔහු යළි ලේක්හවුස් රාජකාරියට වාර්තා කරන්නේ පූර්ණ සුවය ලබා නොතිබුණද රැකියාව රැකගත යුතුවූ බැවිනි.

ජගත් මුල්වරට මරණය ස්පර්ශ කරනු ලැබුවේ එම රෝගී අවස්ථාවේ යැයි මම සිතමි. එයින් පූර්ණ සුවය ලැබීමට ඔහුට වසරක දෙකක පමණ කාලයක් ගතවූ සෙයක් මට මතකය. ඒ වන විටත් ස්ථාපිත ආර්ථික පසුබිමකින් තොරව සිටි ජගත් ඒ කාලය තුළ බෙහෙවින් ආර්ථික අසරණයෙකු බවට පත්කරනු ලැබ තිබිණ. කෙසේ වුවද ඉන් පසු ඔහු ඉන්දියාවේදී ලද අත්දැකීම් පසුබිම් කරගනිමින් 'හීන්අප්පු ආතාගේ දඹදිව චාරිකාව' මැයෙන් පොත් පිංචක්ද ලියා පලකල අයුරු මට මතකය.

ඔහුත් මාත් අතර ගොඩනැඟී තිබූ සහෘද මිතුරු සබඳතාව හදිසියේම ඇණ හිටින්නේ මා ලේකහවුස් ආයතනයෙන් ඉල්ලා අස්වීමත් සමඟිනි. ලේක්හවුසියෙන් ඉවත් වී මම කලින් සිටි රාවය පුවත්පතටම නැවත සම්බන්ධ වූ අතර ජගත් දිණමිනේ සුපුරුදු කටයුත්තේ නිරතව සිටින ආකාරය විටින් විට දිණමින පිටු පෙරළන අවස්ථාවල මට දැකගන්නට ලැබුණද අපගේ මිත්‍ර සමාගම සක්‍රිය වීමට තරම් පරිසරයක් නොවීය.

අපගේ ඇසුර වසර ගණනාවකට පසු යළි ඇරඹෙන්නේ ප්‍රවීණ පුවත්පත් කලාවේදියෙකු වූ ඇස්. පියසේන මහතාගේ නිවෙසේදී අහම්බෙන් නැවත අපි එකිනෙකා හමුවීමෙනි.

ඕස්ට්‍රේලියාවේ ජීවත් වූ පියසේන මහතා එවක සියරට පැමිණි විට මාස කිහිපයක් නවාතැන් ගන්නා නිවෙස පිහිටා තිබුණේ පනාගොඩ මා පදිංචිව සිටි ස්ථානය සමීපයේය. එලෙස සිය රට ගත කරන කාලය තුළ පියසේන මහතා ලංකාදීප පුවත්පතට කොලම් ලිපියක් ලීවේය. ඒ වන විට අනූවිය සපුරමින් සිටි පියසේන මහතාගේ අදහස් එම කොලමට කෙටුම්පත් කිරීමේ කටයුත්ත පැවරී තිබුණේ ජගත්ටය. පියසේන මහතාගේ අතෙහි තිබූ දුර්වලතාවක් ඊට හේතු වීය. ජගත්ගේ ආර්ථික දුෂ්කරතා හඳුනාගෙන සිටි පියසේන මහතා ලංකාදීප පුවත්පතෙන් සිය කොලම් ලිපියට ලැබෙන මුදල ජගත්ටම දෙන බව මා සමඟ කීවේ ජගත්මය. ආර්ථික අසරණයන් පිරිසක් වන ශ්‍රී ලංකාවේ බහුතර ජනමාධ්‍යවේදීන්ගේ ඛේදනීය ඉරණම ඇති වූ සංවේගයත් සමඟ මම ඒ කතා අසා සිටියෙමි. තමන්ද ලේක්හවුස් ආයතනයෙන් ඉවත්වූ බව පැවසූ ජගත් ඉන් පසු ස්ථිර රැකියාවක් නොලද බවත් මේ ආකාරයෙන් ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ විවිධ කුළී වැඩ කටයුතුවලින් යැපෙන බවත් තවදුරටත් ජගත් මා සමඟ පැවසීය.

ජගත් ලේක්හවුස් ආයතනයෙන් ඉවත්වී තිබුණේ විශේෂ හේතුවක් මතය. ආර්. ප්‍රේමදාස ජනාධිපතිවරයාගේ සමයේ නිවාස සංවර්ධන අධිකාරියේ චිත්‍ර ශිල්පියෙකු ලෙස රැකියාව කරමින් සිටියදී ඔහුට මත්තේගොඩ නිවාස සංකීරණයෙන් පදිංචිය සඳහා කුලී නිවෙසක් ලැබී තිබිණ. එහෙත් කිසියම් දේශපාලන හේතුවක් මත මේ නිවෙස මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ කාලයේ නැවත නිවාස අධිකාරිය විසින් පවරාගෙන තිබුණේ ජගත්ගේ කුටුම්භය මහපාරට ඇද දමමිනි. ස්ථිර නිවාස දේපලක් අහිමි ජගත් මත්තේගොඩ නිවාස සංකීර්ණය ආසන්නයේ කුළී නිවෙසක් කෙටි කාලයකට ලබාගෙන සිය කුටුම්භය එහි ගාල්කොට කුමක් කළ යුත්තේදැයි කල්පනා කරමින් සිට ඇත.

වැඩිවිය පත් දියණියක සහ බාල පුතෙකුගේ පියෙකු වූ ජගත්ට ලේක්හවුසියෙන් ලැබෙන පඩියෙන් පවා මේ ප්‍රශ්නයට විසඳුමක් සොයා ගැනීමට අපහසුව තිබියදී, ලේක්හවුස් ආයතනය සිය සේවකයන්ට ස්වෙච්ඡාවෙන් විශ්‍රාම යාමේ ක්‍රමවේදයක් හඳුන්වා දී තිබිණ. එසේ ඉවත්වන අයට සැළකිය යුතු වන්දි මුදලක් ලැබෙන බැවින් ජගත් රැකියාවෙන් ඉවත්වී එම වන්දි මුදල ලබාගෙන තිබිණේ නිවාස ප්‍රශ්නයට විසඳුමක් සෙවීමටය. ලද වන්දි මුදල මූලික ආයෝජනයක් ලෙස යොදමින් කොට්ටාවට ආසන්නයෙන් පර්චස් කිහිපයක බිම් කැබැල්ලක් ගෙන එහි නිවාසයක් අර්ධ වශයෙන් අටවා ගන්නට ඔහු ක්‍රියා කොට තිබුණේ දරුවන්ගේ අනාගතය පිළිබඳ සිතාය.

ජගත් සහ මා අවසන්වරට හමුවන්නේ එම නිවෙසේදීය. වසර තුනකට හතරකට ඉහතදීය. ඒ වන විට ඔහු ගොඩනඟා ගැනීමට අපේක්ෂා කළ ජීවිතය බොහෝ දුරට ඔහු වෙතින් පලාගොස් තිබිණ. ලේක්හවුසියන් ඉල්ලා අස්වීමෙන් පසු ජීවත්වීමට ප්‍රමාණවත් වැටුපක් සහිත මාධ්‍යවේදී රැකියාවක් ඔහුට ලැබී නොතිබිණ. ඒ හේතුවෙන් ජනමාධ්‍ය කුළී වැඩ මත යැපෙමින් බොහෝ ආර්ථික දුෂ්කරතා සහිත ජීවිතයක් ගෙවන්නට සිදුව තිබිණ. බිරියට ස්ථානමාරුවක් ලැබීම හේතුවෙන් ඇය මහනුවර ආසන්නයේ තාවකාලික පදිංචියක් ලබා තිබිණ. පාසලේ පහළ ශ්‍රේණියක අධ්‍යාපනය ලබමින් සිටි පුතාගේ පාසලද පදිංචියද ඊට අනුරූපව වෙනස් කොට ගෙන තිබිණ. දියණිය අධ්‍යාපන කටයුතුවල පහසුව තකා කැළණිය විශ්වවිද්‍යාල ආසන්නයේ නිවෙසක නැවතී සති අන්තයට පමණක් නිවෙසට පැමිණෙන බැවින් ජගත් නිවෙසේ හුදකලාවී සිටියේය.

ඒ මානසික හුදකලාව පෙරටත් වඩා ඔහු පන්සල් සහ භික්ෂූන්වහන්සේලා ඇසුරට නැඹුරු කරවා තිබිණ. බෞද්ධ සඟරා සංසකාරකවරයෙකු වශයෙන් පෙර ලබා තිබූ හුරුව නිසා ඇතැම් බෞද්ධ විහාරස්ථානවල ප්‍රකාශන කටයුතු ඔහු වෙත ලැබෙමින් තිබිණ. ඒ අතර එක්තරා පෞද්ගලික ආයතනයක් මෙහෙයවන දීප ව්‍යාප්ත පෙර පාසල් ගුරු පුහුණු වැඩමුළු මාලාවක සම්පත්දායකයෙකු වශයෙන්ද ඔහු කටයුතු කරමින් සිටියේය. එවැනි විවිධාකාර කුළී වැඩවලින් උපයාගන්නා සීමිත මුදලින් දෙදරූ පියෙකුගේ භූමිකාවට පණ දෙන්නට ඔහු වෙහෙසකර උත්සාහයක නිතරව සිටියේය. ඔහුට පිහිටක් වන්නට හෝ ඔහුගේ දුක සැප විමසීමට දුවන අශ්වයෙකු සමයේ ඔහු වටකොට සිටි මාධ්‍ය සඟයෝද නොවීය. වරින් වර සියරට පැමිණෙමින් සිටි ඇස්. පියසේන මහතාද ජීවිතයෙන් සමුගන්නේ ඒ අවදියේය.

46 වන පිටට